| 11 ශ්‍රේණිය | වලස්මුල්ල අධ්‍යාපන කලාපය.<br>ප්‍රතිඵල ප්‍රවර්ධන වැඩසටහන - 2018<br>**පුරවැසි අධ්‍යාපනය I** | කාලය පැය |
|---|---|---|

නම -......................................................................................................................

1. විධායක සහ පරිපාලන ක්‍රියාමයන් පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් හා සෙසු අයිතිවාසිකම් කඩවන අවස්ථාවලදී ඒවා ආරක්ෂා කරදීම සඳහා රජය පත්කර ඇති නිලධාරියා වන්නේ

   i. නීතිපතිතුමාය
   ii. අධිකරණ අමාත්‍යවරයාය
   iii. කම්කරු කොමසාරිස්තුමාය
   iii. ඔම්බුඩ්ස්මන්වරයාය

2. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

   i. ඉන්දියාව, ශ්‍රී ලංකාව
   ii. ඕස්ට්‍රේලියාව, ස්විස්ටර්ලන්තය
   iii. ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය
   iv. චීනය, උතුරු කොරියාව

3. රාජ්‍යයක උත්තරීතර නීතිය වන්නේ එම රටෙහි

   i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි
   ii. ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවයි
   iii. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
   iv. අධිකරණ සේවාවයි

4. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක නොවීම නිසා

   i. නීතිගරුක පුරවැසියන් ලෙසට ජීවත් වීමට පුරුදු වේ.
   ii. එකිනෙකා අතර අවබෝධය පලුවේ.
   iii. විනිවිද භාවයෙන් යුතුව කටයුතු කරයි.
   iv. එකිනෙකාට ගරු කිරීමට හුරුවේ.

5. ව්‍යවස්ථාදායකයේ බලතල හා කාර්යයන්වලට අදාලවන කරණක් වන්නේ

   i. නීති විවරනය කිරීම.
   ii. නීති සම්පාදනය කිරීම.
   iii. පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
   iv. නඩු විනිශ්වය කිරීම.

6. "කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවද එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය." මානව අයිතිවාසිකම් පිළිබඳව සීමා ඇතිබවට මෙම ප්‍රකාශය කළේ

   i. හැරල්ඩ් ලැස්කිය
   ii. ගැරන් ජෝසප්ය
   iii. ඩඩ්ලි සියර්ස්ය
   iv. ඒබ්‍රහම් ලින්කන්ය

7. 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා ජනන මගින් දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය සභා ගණන

   i. 321 කි.
   ii. 23 කි.
   iii. 41 කි.
   iv. 271 කි.

8. ගෝලීයකරණය ශ්‍රී ලංකාවට සිදුකරනු ලබන සෘණාත්මක බලපෑම් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

   A බුද්ධිගලනය වේගවත් වීම.
   B ගෙවුම් ශේෂ තත්වය යහපත් වීම.
   C ආර්ථිකය විවිධාංගීකරණය වීම.
   D විදේශ විනිමය, ලාභාංශය, පොලී හා ණය වාරික ලෙස විදේශ වලට ඇදී යාම.
   E ආකාර්යක්ෂම කර්මාන්ත විදේශ වෙළෙඳ පොලෙන් ඉවත් වීම.

   1. B හා C ය
   ii. A හා E ය
   iii. A හා D ය
   iv. C හා D ය

9. රටක සංවර්ධනය මැනීමේදී යොදා ගන්නා නූතන මිනුමක් වන්නේ මින් කුමක් ද?
i. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය ii. මූර්ත දළ ජාතික නිෂ්පාදිතය
iii. භෞතික ජීවන තත්ත්ව දර්ශකය iv. ආර්ථික වර්ධන වේගය

10. ස්විට්සර්ලන්තයේ කැන්ටන් හෙවත් ප්‍රාන්තවල ඇති බල තලයක් වන්නේ මින් කුමක් ද?
i. විදේශ රටවල් සමඟ ගිවිසුම් වලට එළැඹීම. ii. අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
iii. පණිවුඩ හුවමාරුව තැපැල් හා විදුලි සංදේශ iv. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම

11. බේරුම් කරුවෙකු තුළ නොතිබිය යුතු ලක්ෂණයකි.
i. හොඳින් සවන් දීම ii. විචාරශීලි හා නිර්මාණශීලි බව
iii. පක්ෂග්‍රාහී වීම iv. සාධාරනභාවය

12. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම හෙවත් නැෆ්ටා මගින් අරමුණු කර ඇත්තේ
i. මූල්‍ය ගනුදෙනු ක්‍රමවත් කිරීම. ii. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දිරි ගැන්වීම.
iii. කලාපීය වෙළඳාම පුළුල් කිරීම. iv. තාක්ෂණික හුවමාරුව

13. ළමයෙකු ලෙසට සැලකෙන වයස් කාණ්ඩය වන්නේ
i. අවුරුදු 14 ට අඩු දරුවන්ය ii. අවුරුදු 18 ට අඩු දරුවන්ය
iii. අවුරුදු 16 ට අඩු දරුවන්ය iv. අවුරුදු 20 ට අඩු දරුවන්ය

14. පාරිසරික ගැටළු ඇතිවීම සඳහා මුල්වන ප්‍රධානතම මානුෂ ක්‍රියාව ලෙසට පෙන්වා දිය හැක්කේ
i. ගෝලීය උණුසුම වැඩිවීම. ii. වර්ෂාපතන ක්‍රියාවලිය වෙනස් වීම.
iii. සම්පත් අධිපරිභෝජනයයි. iv. දිරාපත් නොවන අපද්‍රව්‍ය පොළොව මත බැහැර කිරීමයි.

15. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මනාව අයිතිවාසිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය සම්මත කරන ලද්දේ
i. 1948 දෙසැම්බර් 10 දාය ii. 1948 පෙබරවාරි 04 දාය
iii. 1962 ජුනි 02 දාය iv. 1958 දෙසැම්බර් 10 දාය

16. සංවර්ධනය වන රටවල ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
i. ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩිය. ii. ප්‍රතිශීර්ෂ ආදායම ඉහලය
iii. අධ්‍යාපනික වියදම ඉහලය iv. මානව සංවර්ධන දර්ශකය ඉහලය

17. ශ්‍රී ලංකාව සඳහා රැකියා වෙළඳ පොළක් නිර්මාණය කරදීම සම්බන්ධයෙන් විශේෂ වන රටවල් කවරේ ද?
i. ඉන්දියාව හා ජපානය ii. එංගලන්තය හා ජර්මනිය
iii. මැදපෙරදිග රටවල් හා දකුණු කොරියාව iv. ප්‍රංශය හා චීනය

18. ප්‍රාන්ත 50 කින් සමන්විත සන්ධීය රාජ්‍ය ක්‍රමයක් මගින් පාලනය වන රට
i. ඉන්දියාවයි ii. ජපානයයි
iii. ස්විට්සර්ලන්තයයි iv. ඇමරිකා එක්සත් ජනපදය

19. ශ්‍රී ලංකාවේ සෑම පළාත් සභාවකටම පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ
i. මහ ඇමතිය ii. අග්‍රාමාත්‍යවරයාය
iii. ජනාධිපතිවරයාය iv. නගරාධිපතිවරයාය

20. තිරසාර සංවර්ධනයේ දී පරිසර සංවර්ධනය ආශ්‍රිතව ළඟා කරගත යුතු අභියෝග අතර අදාළ නොවන අභියෝගය කුමක් ද?

i. පරිසර හිතකාමී සම්පත් පරිහරණය ii. වෙළඳපොළ පුළුල් වීම නිසා ඇතිවන තරගය පාලනය
iii. සෞන්දර්යාත්මක බව රැක ගැනීම iv. මිහිතලයට දැරිය හැකි සංවර්ධනය

21. විධායක බලතල සහිත ජනාධිපති ධුරයක් ඇති කිරීම සිදු වූයේ

i. 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රමයයි ii. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රමයයි
iii. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි. iv. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයයි

22. යහ පාලනයක මූලික ගුණාංගයක් නොවන්නේ

i. නිලධාරිවාදය ක්‍රියාත්මක වීමයි ii. මාධ්‍ය නිදහස ආරක්ෂා වීමයි
iii. නිදහස හා සාධාරනත්වය තහවුරු කිරීමයි iv. විනිවිද භාවයෙන් යුතුව කටයුතු කිරීමයි

23. රාජ්‍යයේ බල අධිකාරිය මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී යාම හඳුන්වන්නේ

i. ඒකීය ආණ්ඩු ක්‍රමය ලෙසය ii. පළාත් සභා ආණ්ඩු ක්‍රමය ලෙසය
iii. ප්‍රාදේශීය සභා ආණ්ඩු ක්‍රමය ලෙසය iv. සන්ධීය ආණ්ඩු ක්‍රමය ලෙසය

24. ක්‍රි.ව. 1970 සිට 1977 දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ආර්ථික ක්‍රමය වූයේ

i. ආනයන අපනයන මන්දගාමී ආර්ථික රටාවකි. ii. විවෘත ආර්ථික ප්‍රතිපත්තියකි.
iii. ආවෘත ආර්ථික ප්‍රතිපත්තියකි. iv. අර්ධ විවෘත ආර්ථික ප්‍රතිපත්තියකි.

25. සමාජවාදී අර්ථ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් දෙකකි.

i. ජපානය හා ඕස්ට්‍රේලියාව ii. උතුරු කොරියාව හා කියුබාව
iii. මහා බ්‍රිතාන්‍යය හා ශ්‍රී ලංකාව iv. ඇ.එක්සත් ජනපදය හා ඉන්දියාව

26. මහේස්ත්‍රාත් අධිකරණය සතු බලතල දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A- මැතිවරණ වැරදි සම්බන්ධව ක්‍රියාකිරීමේ බලය
B- ආදායම් පිළිබඳ නඩු විභාග කිරීමේ බලය
C- රජයේ සේවකයින් සම්බන්ධ වැරදි සම්බන්ධව ක්‍රියාකිරීමේ බලය
D- පළාත් සභාව තුළ රීටි ආඥා නිකුත් කිරීමේ බලය
E- රීති සැකසීමේ අධිකරණ බලය

i. A හා C ය ii. B හා D ය iii. D හා B ය iv. A හා E ය

27. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක වීමට බලපාන සාධකයක් නොවන්නේ මින් කුමක් ද?

i. නීතියේ ආධිපත්‍යය පැවැතීම ii. අධිකරණයේ ස්වාධීනත්වය
iii. දේශපාලන අවබෝධයකින් යුතු ජනතාවක් සිටීම. iv. පුද්ගල කණ්ඩායම් වශයෙන් බෙදී සිටීම.

28. යුතුකම් කොටස් දෙකකින් යුක්තවේ. පහත සඳහන් කරුණු අනුව නීතිමය යුතුකම් දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.

A- වැඩිහිටියන්ට සැලකීම
B- රජය විසින් පනවන බදු ගෙවීම
C- ගුරුවරුන්හට සැලකීම
D- පොදු දේපළ ආරක්ෂා කිරීම
E- ජාතික උරුමයන් හා සම්පත් රැක ගැනීම

i. A හා B ය ii. B හා D ය iii. C හා E ය iv. A හා C ය

29. ගිවිසුම්, විවාහ, සම්බන්ධ ගැටළු, බැංකු ව්‍යාපාර, වානිජ කටයුතු, ඉඩම් උරුමයන් අයිතිවාසිකම් සම්බන්ධව බලපවත්නා නීතිය වන්නේ
i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි.   ii. අපරාධ නීතියයි.
iii. අන්තර් ජාතික නීතියයි.   iv. සිවිල් නීතියයි.

30. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදුකරනු ලබන්නේ
i. මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිසන් සභාව මගිනි.   ii. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගිනි.
iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගිනි.   iv. මැතිවරණ කොමසාරිස්තුමා මගිනි.

31. නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙකක් වන අතර ඉන් ශ්‍රමය යොදා භාණ්ඩ නිපදවීම ශ්‍රම සූක්ෂ්ම ක්‍රමය වේ. අනෙක් ක්‍රමය තෝරන්න.
i. පෞද්ගලික සූක්ෂ්ම   ii. විනිමය සූක්ෂ්ම   iii. ප්‍රාග්ධන සූක්ෂ්ම   iv. වෙළඳපොළ සූක්ෂ්ම

32. මේවා අතරින් අන්තර් භාණ්ඩ දෙකක් තෝරා ඇති පිළිතුර කුමක් ද?
ආහාර, ඖෂධ, පොහොර, වාහන, දැව, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගලි, ඇඳුම් පැළඳුම්
i. ඖෂධ, දැව   ii. ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර   iii. වාහන ආහාර   iv. පොහොර, දැව

33. නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනය සඳහා කරන ගෙවීම වන්නේ
i. කුලියයි   ii. ලාභයයි   iii. වැටුපයි   iv. පොලියයි.

34. වායු දූෂණය වන කෘත්‍රිම ක්‍රමයකි
i. ගිනිකඳු පිපිරීම   ii. ලැව් ගිනි   iii. දූවිලි කුණාටු   iv. වනාන්තර විනාශ කිරීම

35. සබරගමුව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක තෝරන්න.
i. රත්නපුර, කෑගල්ල   ii. කොළඹ, ගම්පහ
iii. බදුල්ල, මොනරාගල   iv. අනුරාධපුරය, පොළොන්නරුව

36. පරිසරය සම්බන්ධ පුරවැසි වගකීමක් හා යුතුකමක් වන්නේ මින් කුමක් ද?
i. දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් පරිසර හිතකාමී පුරවැසියන් බිහිකිරීම.
ii. සංවර්ධන කටයුතු වලදී පරිසර පිරිවැය තක්සේරු කිරීම.
iii. රටේ නිෂ්පාදන හා කර්මාන්ත අංශය හරිත ඵලදායිතා සංකල්පය වෙත යොමු කිරීම.
iv. නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැලකීම.

37. නීති සම්මත කිරීම, මුදල් පාලනය, විධායක පාලනය කිරීම ආදී කටයුතු බාරව ඇත්තේ
i. විධායකයටය   ii. ව්‍යවස්ථාදායකයටය   iii. අධිකරණයටය   iv. අගමැතිතුමා හටය

38. දෙපාර්ශවයටම "ජය - ජය" විසඳුම් ලබාගත හැකි වන්නේ ගැටුම් නිරාකරණයේ ක්‍රමයක් වන
i. කේවල් ක්‍රමය මගිනි   ii. සහමන්ත්‍රය මගිනි
iii. සාකච්ඡා කිරීමේ ක්‍රමය මගිනි   iv. මැදහත්කරණය මගිනි

39. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ පරිපාලන බලතල විමධ්‍යගත කිරීමේදී ජාතික මට්ටම බාරව ඇත්තේ
i. ග්‍රාම නිළධාරි හටය   ii. අමාත්‍යාංශ ලේකම් හටය
iii. දිස්ත්‍රික් ලේකම් හටය   iv. ප්‍රාදේශීය ලේකම් හටය

40. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති දෙපාර්තමේන්තුව වන්නේ
i. අධ්‍යාපන දෙපාර්තමේන්තුවයි   ii. කාන්තා කාර්යාංශයයි
iii. පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුවයි   iv. ශ්‍රී ලංකා වරාය අධිකාරියයි

| වලස්මුල්ල අධ්‍යාපන කලාපය. | | |
|---|---|---|
| II ශ්‍රේණිය | ප්‍රතිඵල ප්‍රවර්ධන වැඩසටහන - 2018 | කාලය පැය |
| | පුරවැසි අධ්‍යාපනය II | |

නම -..........................................................................................

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1.

1. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක නම් කරන්න.
2. ස්විස්ටර්ලන්තයේ සංධිය රාජ්‍යයක් බිහිකර ගැනීමට බලපෑ හේතු 2 ක් සඳහන් කරන්න.
3. බහුසංස්කෘතික සමාජයක් බිහිවීම කෙරෙහි බලපෑ සාධක 2 ක් සඳහන් කරන්න.
4. යහපාලනයේ මූලික ගුණාංග 2 ක් සඳහන් කරන්න.
5. සමාජවාදී ආර්ථික ක්‍රමයේ ලක්ෂණ 2 ක් ලියන්න.
6. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 2 ක් සඳහන් කරන්න.
7. තේසවලාමේ නීතිය ක්‍රියාත්මකවන අවස්ථා 2 ක් ලියන්න්.
8. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් නවාංග 2 ක් ලියන්න.
9. මිනිසා මූලික වීමෙන් සිදුවන පාරිසරික ගැටලු 2 ක් සඳහන් කරන්න.
10. මානව සංවර්ධන දර්ශනය සැකසීමට යොදා ගන්නා නිර්වචන 2 ක් ලියන්න.

(2×10= 20)

2. i. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 2)

ii. ආණ්ඩුව සමන්විත වන ප්‍රධාන ආයතන 3 නම් කරන්න. (ලකුණු 3)

iii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්නා රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන 5 ක් සඳහන් කරන්න. (ලකුණු5)

3. i. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම යටතේ 1865 මහනගර ආඥාපනත මගින් පිහිටවනු ලැබූ මහනගර සභා දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. බ්‍රිතාන්‍ය පාලනය සමය තුළ බලය විමධ්‍යගත කිරීම සඳහා පහත සඳහන් වර්ෂවල ගත් විධිවිධාන නම් කරන්න.

1. 1871
2. 1940
3. 1943

(ලකුණු 3)

iii. සංධිය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ 3 ක් සහ අයහපත් ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 5)

4. i. බහු සංස්කෘතික ජන සමාජයක දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් ලියන්න. (ලකුණු 2)

ii. සංස්කෘතියට අයත් අංග 3 ක් ලියන්න. (ලකුණු 3)

iii. බහු සංස්කෘතික ජනසමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියන් විසින් ඉටුකළ යුතු යුතුකම් 3 ක් දක්වා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 5)

5. i. ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන " කේවල් කිරීම්" ක්‍රමයෙහි ලක්ෂණ 2 ලියන්න.

(ලකුණු 2)

ii. ගැටුම් නිරාකරණයේ දී " මැදිහත්කරුවෙකු" යොදාගත හැකි අවස්ථා 3 ක් සඳහන් කරන්න.

(ලකුණු 3)

iii. සමතකරුවෙකුගේ කාර්යයන් 3 ක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි (ලකුණු 5)

6. i. මානව අයිතිවාසිකම් අතරින් දේශපාලන අයිතිවාසිකම් 2 ක් ලියන්න. (ලකුණු 2)

ii. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මගින් පිළිගෙන ඇති අයිතිවාසිකම් 3 ක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග 3 ක් සඳහන්කර ඉන් එකක් විස්තර කරන්න.

7. i. රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථ 2 ක් නම් කරන්න.

ii. සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන සම්ප්‍රදායික මිනුම් 3 ක් ලියන්න.

iii. තිරසාර සංවර්ධනය ළඟාකර ගැනීමට ජයගත යුතු අභියෝග 3 ක් නම් කර ඉන් 1 ක් විස්තර කරන්න.

8. i. වන හායනයට බලපාන හේතු 2 ක් නම් කරන්න.

ii. වන හායනය නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල 3 ක් දක්වන්න

iii. පරිසරය සුරකීම සඳහා පුරවැසියෙකු විසින් ඉටුකළ යුතු යුතුකම් සඳහන්කර ඉන් එකක් විස්තර කරන්න.